# ලෝක ආර්ථික අර්බුද අවම කිරීම සඳහා බුදුදහමින් ලබාගත හැකි ආදර්ශ පිළිබඳ අධ්‍යයනයක්

ඩී. කේ. චම්පිකා[1]

## හැඳින්වීම :

රටක ආර්ථික ක්‍රියාකාරිත්වය එම රටෙහි ජනජීවිත වලට සෘජුවම බලපානු ලබන්නකි. ගෝලීයකරණය යටතේ සියලුම රටවල් එකට බැඳී පවතින මෙවන් වකවානුවක එම තත්ත්වය වඩාත් තීව්‍ර වන අතර එක් රටක සිදුවන සංසිද්ධීන් ඒ හා බැඳී පවතින අනෙකුත් සියලුම රටවලට අඩු වැඩි වශයෙන් නිතැතින්ම බලපානු ලැබේ. ඇමරිකාවේ ඇතිවූ මූල්‍ය අර්බුදය මගින් එය වඩාත් හොඳින් අවබෝධකර වූවක් වන අතර එහි බලපෑම ලෝකයේ බොහෝ රටවලට ව්‍යාප්ත විය.

ආර්ථික අර්බුදය පිළිබඳව ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී මූලාශ්‍ර වල සඳහන් ආකාරයට ලොව ප්‍රථම ආර්ථික අර්බුදය 1639 දී ඕලන්දයේ හටගෙන ඇත. අනතුරුව 21 වන සියවස වන විට විවිධ අවස්ථාවන්හිදී ලොව විවිධ රටවල ආර්ථික අර්බුද වාර්තා වූ අතර විවෘත ආර්ථිකය හා ගෝලීයකරණ ක්‍රියාදාමය මත මෑතකාලීනව ලොව විවිධ රටවල් නිරන්තරයෙන් ආර්ථික අර්බුදවලට ලක්වීම ද දැකිය හැකිය. එකී අර්බුදවලින් ලක්ෂ සංඛ්‍යාත ජනජීවිත, රැකියා, දේපොළ, සම්පත් සුලු කාලයක් තුළ විනාශයට පත් වී ඇත.

## පර්යේෂණ ගැටලු

ඒ අනුව මෙකී පසුබිම තුළ මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ 2007-2010 ඇමරිකාවෙන් ආරම්භ වී ලොව පුරා ව්‍යාප්ත වූ ආර්ථික අර්බුදය ඇති වීමට බලපෑ හේතු මොනවාද? යන්න අධ්‍යයනය කිරීම හා එවන් අර්බුද අවම කිරීම සඳහා බුදුදහමින් ලබාගත හැකි විසඳුම් මොනවාද? යන්න අධ්‍යයනය කිරීම වේ.

## පර්යේෂණයේ අරමුණු හා වැදගත්කම

ඒ පිළිබඳව මනාව අවබෝධ කර ගැනීම පර්යේෂණයේ අරමුණ වන අතර ඒ ඔස්සේ ශ්‍රී ලංකාවේ ඇතිවිය හැකි එවන් අර්බුද අවම කිරීමටත්, අනාගතයේ

---

1 ආර්ථික විද්‍යාව හිටපු නිබන්ධන උපදේශිකා, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය. champikadolamulla@gmail.com

ගෝලීය වශයෙන් ඇතිවිය හැකි එවන් අර්බුදවලින් ශ්‍රී ලංකාවට ඇතිවිය හැකි අවදානම අවම කිරීමටත් හැකියාව ලැබීම පර්යේෂණයේ වැදගත්කම වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ අරමුණ තෘප්ත කර ගැනීම සඳහා මිශ්‍ර ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු හා දත්ත ද්විත්වයම රැස්කර ගනු ලැබූ අතර ද්විතීයික මූලාශ්‍ර වන පොත්පත්, සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ඒ සඳහා උපයෝගී කරගනු ලැබිණ. රැස්කරගත් තොරතුරු හා දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කර අදාළ නිගමන වලට එළඹෙන ලදි. ඒ අනුව ලොව ශක්තිමත් ආර්ථිකයක් වන ඇමරිකානු ආර්ථිකයේ මෙවැනි ප්‍රබල ආර්ථික අර්බුදයක් හටගත් ආකාරයත් එයට බලපෑ හේතු පහත පරිදි හඳුනාගත හැකි විය.

## පර්යේෂණයේ ප්‍රතිඵල

දශක ගණනාවක් තිස්සේ ඉතා දියුණු ආර්ථිකයකට උරුමකම් කියමින් ආර්ථික බලවතුන් ලෙස පැවති ඇමරිකාව මෙම ආර්ථික අර්බුදය මත දැඩි කම්පනයනට ලක්විය.

මෙවන් ආර්ථික අර්බුදයක් ඇමරිකාව තුළ ආරම්භ වීමට හේතු රාශියක් බලපා ඇති බව අධ්‍යයනය මගින් හෙළි වූ අතර ඊට බලපෑ සෘජු හේතු පමණක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබේ. මේ සඳහා ප්‍රබලතම හා ආසන්නතම හේතුව වන්නේ දියුණු ආර්ථිකයකට හිමිකම් කියූ ඇමරිකාව 2003 වර්ෂයේදී 'සෑම ඇමරිකානුවෙකුටම නිවසක්' ලබා දීමේ පරමාර්ථයෙන් නිවාස ණය ලබා දීමට තීරණය කිරීමයි. ඉතා අඩු පොළියක් යටතේ ණය ලබා දීමට රජය බැංකු වෙත උපදෙස් දී තිබිණ. ආයෝජන තවත් වර්ධනය කිරීම සඳහා ආර්ථිකයේ සමස්ත පොලී අනුපාතය ද පහළ හෙළන ලදි. එබැවින් සමාජයේ නිවාස අහිමි බොහෝ පුද්ගලයන් නිවාස ණය ලබාගෙන නිවාස ඉදි කිරීමට යොමු විය. නිවාස ඉදිකිරීමේ අමුද්‍රව්‍ය ඉල්ලුම මේ හේතුවෙන් ඉහළ නැග තිබූ අතර එබැවින් නිවාස මිල ද ඉහළ මට්ටමකට පත් වීමට පටන් ගෙන තිබිණ. අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට සිතූ ආයෝජකයන් ද නිවාස ණය ලබාගෙන නිවාස ඉදිකර බද්දට දීමට හෝ අළෙවි කිරීමට පෙළඹිණ. නිවාස ණය ඉල්ලුම දෛනිකව ඉහළ යාමෙන් බැංකු පද්ධතියට අමතරව වෙනත් මූල්‍ය ආයතන (Nether Rock, Country Wide, Leamon Brothes) යනාදිය ද නිවාස ණය ලබා දීමට යුහුසුළු විය. ණය පදනමක් නොමැති ණය ගෙවීමේ හැකියාවක් නොමැති පුද්ගලයන්ට(Sub Prime Coustomer) පවා ණය ලබා දීම සිදු විය. 2007 පමණ වන විට මෙම තත්ත්වය උමතුවක් බවට පත් වූ

අතර ඇතැම් ව්‍යාපාරිකයින් තමන් සතු වෙනත් ස්ථාවර වත්කම් අළෙවි කරමින් පවා නිවාස ඉදි කිරීමට පෙළඹිණ.

මෙම කාල සීමාව තුළ ඉන්දියාව වැනි නැගී එන නව ආර්ථික හිමි රටවලින් බණිජ තෙල් ඉල්ලුම ඉහළ යාමෙන් ලෝක ආර්ථිකයේ බණිජ තෙල් මිල ගණන් ඉහළ යන්නට විය. මේ හේතුවෙන් ගෝලීය උද්ධමනය ක්‍රමයෙන් වර්ධනය වූ අතර ඇමරිකානු ආර්ථිකය තුළ ද උද්ධමනය ක්‍රමයෙන් වර්ධනය විය. ඇමරිකානු ආර්ථිකයේ උද්ධමය අවම කිරීමේ අරමුණින් රජය ජනතාව අතැති මුදල් ප්‍රමාණය අඩු කරමින් ඉතිරි කිරීම් වලට පෙළඹීම සඳහා ආර්ථිකයේ පොළී අනුපාතය ඉහළ නංවන ලදි. මේ හේතුවෙන් නිවාස ඉදිකිරීමට අධික ලෙස ණය ලබාගෙන සිටි ජනතාවට ඉමහත් ගැටළුකාරී තත්ත්වයක් උත්ගත විය. උච්චාවචනය වන පොලී අනුපාත(Floting Interest) යටතේ මෙම ණය ලබාගෙන තිබූ බැවින් ගැටළුව තවත් උග්‍ර විය. ණය පොළිය ඉහළ මට්ටමකට පත් විය. බොහෝ ජනතාවට ණය වාරිකය හෝ පොළී අනුපාතයවත් ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා විය. මේ හේතුවෙන් ඇතැම් ජනතාව ඉදිකළ නිවාස විකුණා දමමින් ණය ගෙවීමට පෙළඹිණ. කල්යත්ම සමාජයේ බොහෝ පිරිසක් නිවාස අළෙවි කරමින් ණය ගෙවීමට උත්සාහ කළ ද නිවාස මිලදී ගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවිණ. පාඩුව අවම කර ගැනීමට නිවාස මිල අඩු කර අළෙවි කිරීමට උත්සාහ කළද බොහෝ උත්සාහයන් ව්‍යර්ථ විය. වේගයෙන් නිවාස මිල අඩු වීමට පටන් ගැණින. බොහෝ ජනතාව මෙන්ම ලාභ ලැබීමේ චේතනාවෙන් අධික ලෙස නිවාස ඉදිකළ ආයෝජකයන් ද අසරණ විය.

මේ හේතුවෙන් ණය ලබා දුන් බැංකු සහ මූල්‍ය ආයතන ද ණය ආපසු අය කර ගැනීමට නොහැකිව දැඩි අපහසුතාවයට පත් විය. මුදල් ඉතිරි කරන ලද ජනතාව ද මුදල් අහිමි වේය යන අදහසින් නැවත මුදල් ඉල්ලුම් කරන්නට පටන් ගැණින. බැංකු අර්බුදයකට පත් වූ අතර එහි ප්‍රතිඵල ලෙස 2008 සැප්තැම්බර් මස ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදිතය මෙන් 16 ගුණයක් වත්කම් පැවති ලේමන් බ්‍රදර්ස් මූල්‍ය ආයතනය (Leamon Brothes) ඇවර කිරීමට තීරණය කෙරිණ. 2011 වන විට ඇමරිකාවේ බැංකු 311 ක් මේ හේතුවෙන් වසා දමා ඇත. ඇමරිකානු ආර්ථිකය වාර්ෂිකව 6.2% කින් සංකෝචනය විය. ඇමරිකාව හා සම්බන්ධ සෙසු රටවලටද මෙම ආර්ථික අර්බුදය පැතිර ගිය අතර ලෝක ආර්ථිකය 6%කින් සංකෝචනය විය. චීනයේ 69%, ජපානය 57%, හොංකොං 59%, ජර්මනිය 45% කින් කොටස් වෙළෙඳපොල බිඳ වැටිණ. යුරෝපා කලාපයේ ම විරැකියාව වර්ධනය විය, රාජ්‍ය ණය, අයවැය හිඟය වර්ධනය වූ අතර ශ්‍රී ලංකාවේ ද අපනයන අඩාල වීම,

සංචාරක කර්මාන්තය බිඳවැටීම, ආධාර ලැබීම් අඩු වීම, විදේශ ආයෝජන ලැබීම් අඩු වීම සිදු විය.

කෙසේ නමුදු සම්බුද්ධ දේශනාවලට අනුව ආර්ථිකයක් කටයුතු කළේ වී නම් මෙවන් ව්‍යසනයකට ආර්ථිකයක් කිසිසේත්ම මුහුණ නොදෙන බව අධ්‍යයනය මගින් නිගමනය විය. එයට හේතුව සම්බුදු දහමේ අන්තර්ගත ව්‍යග්ගපජ්ජ සූත්‍රය, අණන සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, පත්තකම්ම විභංග සූත්‍රය, පංච භෝගාදිය සූත්‍රය, අච්චායික සූත්‍රය, වණිජ්ජා සූත්‍රය, චක්කවත්ති සිහනාද යනාදී සූත්‍ර දේශනා මගින් ද චුල්ලසෙට්ඨි ජාතකය, ජන සත්ව ජාතකය, මයිහක ජාතකය මෙන්ම ධම්ම පදය මගින් ආර්ථික කළමනාකාරිත්වය පිළිබඳ මනා මග පෙන්වීමක් සිදු කර තිබීමය. එහිදී පුද්ගලයා ධනය ඉපයීම හා වියදම් කිරීම ක්‍රමානුකූලව සිදුකළ යුතු ආකාරය මැනවින් විග්‍රහ කර ඇත. දෑතේ දෙපයේ වීර්යයෙන් දහඩිය වගුරුවා ධාර්මිකව ධනය උපයන මාර්ග වලින් ක්‍රම ක්‍රමයෙන් (මී මැස්සෙකු රොන් ගෙන මී වද බදින්නා සේ) ධනය රැස් කිරීම ද ඒ අයුරින් රැස් කරගත් ධනය තමාගේත් තම හිතෛශීන්ගෙත් මුළුමහත් සමාජයේත් මෙලොව පරලොව අභිවෘද්ධිය උදෙසා ක්‍රමානුකූලව වියදම් කළ යුතු ආකාරයත් සරලව සිත් ගන්නා සුළු ආකාරයට උපමා හා කතාන්දර ආශ්‍රයෙන් වර්තමාන සමාජයට ද ගැලපෙන ආකාරයට ඉදිරිපත් කර ඇත.

''න කහාපන වස්සේන තිත්ථි කාමේසු විජ්ජතී" එනම් පෘථග්ජන මිනිසා කහවනු වර්ෂාවක් වැස්සත් තෘප්තිමත් නොවේ. එසේ වූ මිනිස් ජීවිතය අසීමාන්තිකව ණය ලබාගෙන අණන සුඛය නොමැතිව අධික තෘෂ්ණාවෙන් යුතුව ඇමරිකාව ප්‍රමුඛ බලවත් රාජ්‍යය ප්‍රබල ආර්ථික අර්බුදයකට මුහුණ දෙන ලදි.

සම්බුදු දහමින් මීට වසර 2500කට පෙර දේශිත ආර්ථික කළමනාකරණය මගින් සෙසු ආර්ථික දර්ශනයන් අභිබවා විශිෂ්ට මාර්ගෝපදේශකත්වයක් ලබා දෙන දහමක් බවට පත් වී ඇත. එකී හරයන් උකහාගෙන එයට අනුව ජීවිතය හැඩගස්වා ගනු ලබන ලොව කිසිම ආර්ථිකයකට ආර්ථික අර්බුදවලින් පීඩා විඳීමට සිදු නොවන බව සම්බුදුදහමේ ආර්ථික කළමණාකරනය අධ්‍යයනය මගින් නිගමනය විය.

**ආශ්‍රිත ග්‍රන්ථ :**

සමරසිරි, පී, (2007-2011). *ලෝක මූල්‍ය සහ ආර්ථික අර්බුදය*, සටහන සඟරාව, 2011 සැප්/ඔක් පිටු. 18-22

කෙනෙත් ද සිල්වා, *ගෝලීය මූල්‍ය අර්බුදය.* ආර්ථික විමසුම සඟරාව. 2009 අප්‍රියෙල්/මැයි. පිටු. 17-23)



BHIKSHU UNIVERSITY OF SRI L...
07 APR 2015
LIBRARY